## 106 – දෙව්දුනි ඔබ හට වඳිනු සදා

දෙව්දුනි ඔබ හට වඳිනු සදා
ඔබ පුතු පඬුරම පුදමු මෙදා
දිව් දෙන පූපය මෙන්න අපේ
මිදිරස සිරිලෙය ගන්න පියේ

දෝතට අරගෙන පඬුරු කරන්නට
ඔබ වෙත රොක් වෙමු ජය ශ්‍රී පතුරා
රස පැන් මිදි රස හා මුසු වී
මනු බව සඟවයි දේව බවේ

ජේසුනි හද තුළ අප සඟවා
දෙව් දරු කරන්න පවින් මුදා
දිව් දෙන පූපය මෙන්න අපේ
මිදිරස සිරිලෙය ගන්න පියේ

සැම රසයෙන් ගෙන මිදිරස බේරා
ආවෙමු පුදනට පූපය තනවා
දෙව් බව දක්වමු ලොව සැමටා
හොඳ හිත පාමින් දෙව් පිනෙනා